# බටහිර විද්‍යාව චීනයෙහි ඇති නොවූයේ ඇයි?

නූතනත්වය යනු කුමක් ද? මෙහි දී නූතනත්වය යනුවෙන් සඳහන් කෙරෙන්නේ බටහිර නූතනත්වය බව අමතක නොකළ යුතු ය. මෙරට හෝ වෙනත් ආසියාතික හෝ අප්‍රිකානු රටක බටහිර නූතනත්වය ඇත්තේ බටහිර යටත්විජිතවාදයෙහි ප්‍රතිඵලයක් ලෙස උඩින් ගෙනැවිත් සමාජයට ආරෝපණය කළ දෙයක් වශයෙනි. බටහිර නූතනත්වය කිනම් ආකාරයකට හෝ එවැනි රටවල නිසගයෙන් ඇති වූවක් නොවේ. අප බටහිර නූතනත්වය ගැන යම් ප්‍රමාණයකට හෝ දැනගත යුත්තේ ඇයි? එයට ප්‍රධාන හේතුව නම් අප පෙළන බටහිර යුදෙව් ක්‍රිස්තියානි යටත්විජිතවාදය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට ඒ හැදෑරිය යුතු වීම ය. බටහිර විද්‍යාව හදාරන්නකුට වුව ද තමන් කරන්නේ කුමක් ද යන්න, එසේත් නැත්නම් තමන් හදාරණ විෂය නිර්මාණය වූයේ කිනම් වටාපිටාවක ද යන්න දැන ගත හැක්කේ බටහිර නූතනත්වය ගැන යම් දැනුමක් ලබා ගැනීමෙනි.

එංගලන්තයේ ජීවත් වූ ජෝසප් නීඩ්හම් නම් විද්වතා චීනයේ විද්‍යාව පිළිබඳ ව ගැඹුරු අධ්‍යයනයක් කෙළේ ය. පසුගිය වසර පණහක පමණ කාලය තුළ ලෝකයට ලැබුණු වටිනා ම දැනුම් සම්භාරයක් වූයේ චීන විද්‍යාව පිළිබඳ ව එතුමාගේ ප්‍රධානත්වයෙන් කෙරුණු අධ්‍යයනයේ ප්‍රතිඵල ය. පැරණි චීනයේ ඉතා වැදගත් විද්‍යාවක් තිබුණු බවත් ඒ ඇතැම් දැනුම් බටහිරයන් දැනගත්තේ ඉතා මෑතක බවත් නීඩ්හම් අධ්‍යයනයෙන් හෙළිවිණි. මෙවැනි අධ්‍යයනයක් තවමත් භාරතීය විද්‍යාව සම්බන්ධයෙන් නොකර තිබීම කණගාටු දායක ය.

චීන විද්‍යාව පිළිබඳ හදාරන අතර නීඩ්හම් පඬිතුමා ඇසූ ප්‍රශ්නයක් අපට ඉතා වැදගත් වෙයි. චීනයට එතරම් දැනුම් සම්භාරයක් එපමණ ඈත කාලයක සිට තිබියදීත් චීනයෙහි බටහිර විද්‍යාව නමින් අප අද හඳුන්වන දැනුම් පද්ධතිය ඇති නොවූයේ ඇයි දැයි එතුමා ප්‍රශ්න කෙළේ ය. බටහිර විද්‍යාවේ හා බටහිර සභ්‍යත්වයේ පදනම සකස් කිරීමට උපකාරි වී යැයි බොහෝ බටහිර පඬුවන් විශ්වාස කරන්නේ වෙඩි බෙහෙත්, මාලිමා යන්ත්‍රය හා මුද්‍රණ ශිල්පය ගැන බටහිරයන් ලබා ගත් දැනුම ය. මේ දැනුම බටහිරයන් අතට පත්වීමට සියවස් ගණනකට පෙර චීන ජාතිකයෝ දැන සිටියහ. එහෙත් චීන ජාතිකයෝ බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් හෝ බටහිර සභ්‍යත්වය වැනි සභ්‍යත්වයක් හෝ නිර්මාණය නොකළහ. නීඩ්හම් පඬිතුමාට ප්‍රශ්නයක් වූයේ චීන ජාතිකයන් එසේ නොකෙළේ ඇයි ද යන්න ය.

මෙහි දී මෙයට කෙළින් ම සම්බන්ධ නැති වුවත් ඉතා වැදගත් කරුණක් සඳහන් කළ යුතු ය. එනම් ලෝකයේ ඉතා පැරණිම ජාති දෙක චීන හා සිංහල ජාති බව ය. බටහිරයන් අනුව යන ඇතැම් අනුකාරකයන්ට අනුව නම් සිංහල ජාතිය ඇති වූයේ ධනපති ක්‍රමය ඇති වීමෙන් පසුව ය. ඔවුන් එසේ කියන්නේ බටහිරයන්ගේ නිර්ණායක අනුව ජාතියක් ඇතිවන්නේ ධනපති ක්‍රමය තුළ වීම නිසා ය. එහෙත් එය එසේ නොවේ. සිංහලයන් හා චීනුන් එක් භාෂාවක් කතාකරන, එක් සංස්කෘතියක්, එක් ජීවන ක්‍රමයක් හා එක් චින්තනයක් ඇති, රටක්, දේශයක් යනුවෙන් හැඳින්වෙන එක් භූමි ප්‍රදේශයක ජීවත්වන, සමස්ත ජන සංඝය පුරාම අධිකාරය දරන එක් රාජ්‍යයක් (සිංහලයන්ගේ නම් එක් සේසත් රාජ්‍යය) ඇති, ජාතියක් පිළිබඳ විඥානයක් ඇති හා අඛණ්ඩව පාරම්පරිකව ඒ සියල්ල ඊළඟ පරම්පරාවට උරුම කර දෙන ජන සංඝ බවට පත් වූයේ යුරෝපයේ ජාතීන් ඇති වීමට අවුරුදු දහස් ගණනකට පෙර ය. චීන ජාතිකයන්ට ඇත්තේ රටක් හා ජාතියක් පමණක් වුව ද දුටු ගැමුණු රජතුමාගෙන් පසුව සිංහලයන්ට, සිංහල බෞද්ධයන් බවට පත්වීමෙන් පසුව, රටක් ජාතියක් පමණක් නොව සමයක් ද හිමි විය. අප රට, දැය, සමය ගැන කතා කරන්නේ එබැවිනි. මේ සිංහල බෞද්ධයන්ගේ සුවිශේෂ ලක්ෂණයක් වෙයි.

චීන ජාතිකයන් බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් බිහි නොකෙළේ ඇයි ද යන ප්‍රශ්නයට නීඩ්හම් මහතා පිළිතුරක් ද සැපයී ය. ඔහුට අනුව එයට හේතුව චීනයේ ධනපති ක්‍රමය බිහි නොවීම ය. නීඩ්හම් මහතා පවසා සිටියේ බටහිර විද්‍යාව යුරෝපයේ පහළ වීමට හේතුව එහි ඇති වූ ධනපති ක්‍රමය බව ය. ධනපති ක්‍රමය විසින් බටහිර විද්‍යාව ඇති කළ බව ඒ මහතාගේ අදහස විය. එහෙත් මෙහි දී ප්‍රශ්න දෙකක් ඇසිය හැකි ය. එකක් නම් ධනපති ක්‍රමය චීනයේ හෝ වෙනත් රටක ඇති නොවී යුරෝපයේ පමණක් ඇති වූයේ ඇයි ද යන්න ය. මාක්ස්වාදීන්ගෙන් වුව ද ඇසිය යුතු ප්‍රශ්නය නම් ඊනියා වැඩවසම් රාජ්‍යය බටහිර යුරෝපයේ පමණක් පෙරළා දැමුණේ ඇයි ද යන්න ය. අපට ඇසිය හැකි දෙවැනි ප්‍රශ්නය නම් බටහිර විද්‍යාවේ පුරෝගාමීන් වූ කොපර්නිකස්, ගැලීලියෝ ගැලීලි වැනි විද්වතුන් තබා අයිසැක්

© Prof. Nalin De Silva

නිව්ටන් පඬිවරයාවත් ජීවත් වූයේ ධනපති රාජ්‍යවල ද යන්න ය. මේ සියල්ලෝම මාක්ස්වාදීන්ට හා වෙනත් බටහිරයන්ට අනුව යුරෝපීය වැඩවසම් රාජ්‍යවල බිහි වූහ.

බටහිර විද්‍යාව වෙනත් රටවල ඇති නොවී යුරෝපයේ, විශේෂයෙන් ම බටහිර යුරෝපයේ, ඇති වූයේ ඇයි ද යන්නට දිය හැක්කේ සංකීර්ණ පිළිතුරකි. එහි පදනමේ ඇත්තේ චින්තනය යන්න ය. චීන චින්තනය කොන්ෆියුෂියස් දහම හා ටාඕ දහම සමග මුල දී බැඳුණි. මේ දහම් දෙක අතර වෙනස්කම් තිබුණ ද ඒ දහම් සංකලනයෙන් ඇති වූ චින්තනයක් චීනුන්ට තිබිණි. කොන්ෆියුෂියස් දහම පරිපාලනයේ දී වැදගත් වූ අතර ජන ජීවිතය ටාඕ දහම සමග බැඳුණි. යමක් එහි විරුද්ධය තුළ ද ඇති බව පිළිගන්නා යින් යැන් දර්ශනය, එමගින් ඇරිස්ටෝටලීය මධ්‍යය බැහැර කිරීම නොසැළකීම, ස්වභාව ධර්මයෙන් වෙන් වී ඒ පාලනය නොකර ඒ සමග සහජීවනයෙන් විසීම, සමස්තය සැළකීම ආදිය චීන චින්තනයෙහි පදනමේ විය. චීන චින්තනය සියල්ල එකක් හෝ කිහිපයක් මගින් තේරුම් ගැනීමට, එනම් දැනුම එකකට හෝ කිහිපයකට හෝ ඌනනය කිරීමට නොපෙළඹුණේ ය. ග්‍රීක ස්වසිද්ධිමූලක ක්‍රමය චීන චින්තනයට ආගන්තුක විය. චීන ජාතිකයෝ වියුක්ත ව නොසිතූහ. චීන චින්තනයෙහි දේව නිර්මාණයක් නොවී ය. පසු කලෙක භාරතයෙන් ලැබුණු මහායාන බුද්ධාගම චීනයේ මුල් බැස ගැනීමට හේතුවක් වූයේ ද මේ චීන චින්තනය යි. එහි දී මහායාන බුදු දහමේ ද තරමක් හෝ වියුක්ත දර්ශන චීන චින්තනය විසින් ප්‍රතික්ෂේප කරන ලදී. මහායාන බුදු දහම තාර්කික පද්ධතියකට වඩා ජීවිතයට හා ටාඕ ට බැඳුණු දහමක් බවට චීනයේ දී පරිවර්තනය විය. මෙවැනි චින්තනයක් පදනම් කර ගනිමින් බටහිර විද්‍යාව වැනි දැනුම් පද්ධතියක් බිහි වීමට අවකාශයක් නොවී ය.

වෙඩි බෙහෙත්, මුද්‍රණ ශිල්පය හා මාලිමා යන්ත්‍රය පදනම් කර ගනිමින් නාවික හමුදාවක් තනා ලෝකය වටේ ගොස් තම ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ආධිපත්‍යය ලෝකයෙහි පිහිටුවීමෙහි අවශ්‍යතාවයක් ද චීන චින්තනය තුළ පැන නැගීමට ඉඩක් නැත. එවැනි අවශ්‍යතාවයක් ඇතිවන්නේ ලෝකයෙහි ස්වාමීත්වය තමන්ට ඇතැයි සිතන චින්තනයක් තුළ ය. ( චින්තනය යනු සිතීම නොවන බවත් මිනිසුන් සිතන්නේ ද චින්තනයක් තුළ බවත් මේ වන විට ඔබට අවබෝධ වී ඇතැයි සිතමි.) මෙයින් අදහස් කරන්නේ චීන ජාතිකයන් වෙනත් රටවල් ආක්‍රමණය නොකළ බව නොවේ. ආසන්න රටක් ආක්‍රමණය කර පාලනය කිරීම, තවත් රටකට සංක්‍රමණය වී ඒ රටේ ජනතාව සමග සටන් කර පසුව ඒ ජනතාව සමග එක්වී අළුත් සංස්කෘතියක් ගොඩනැගීම ආදිය හා බටහිරයන් ලෝකය පුරා ගොස් ආර්ථික, සංස්කෘතික හා දේශපාලන ආධිපත්‍යය පිහිටුවීම අතර ඇත්තේ ගුණාත්මක වෙනසකි.

බටහිර නූතනත්වය ඇති වීමට පෙර බටහිර යුරෝපයේ තිබූ චින්තනය ගැන යම් අවබෝධයක් තිබිය යුතු ය. ඒ චින්තනය අපි කතෝලික චින්තනය යන නමින් හඳුන්වමු. කතෝලික චින්තනය පෙරදිග, විශේෂයෙන් ම භාරතීය චින්තනවලට සමීප බව කලින් ලිපියක සඳහන් කර ඇත. එහෙත් කතෝලික චින්තනයේ ලක්ෂණ කිසිවක් ගැන අපි සාකච්ඡා නොකෙළෙමු. කතෝලික යන වචනයෙහි තේරුම සමස්තය යන්න ය. දෙවියන් වහන්සේ විසින් මවන ලද සමස්ත ලෝකයක් ගැන කතෝලික චින්තනයෙහි වෙයි. චින්තනයක ඥාන විභාගයක් (හා සත්බවක්) ගැන කියැවෙයි. එමෙන්ම එහි දාර්ශනික පසු බිමක් ද ආකල්ප ද වෙයි. (ජාතික චින්තනය ජාතිවාදී ය ද්වේෂ සහගත ය ආදී වශයෙන් කියන්නන් කිසිවකු ජාතික චින්තනය තබා චින්තනය යනු කුමක් දැයි දන්නේ යැයි මම නොසිතමි. චින්තනය යන්න ගැඹුරු සංකල්පයකි. දැනුම නිර්මාණය වන්නේ චින්තනයක් තුළ ය. ජාතික චින්තනය යනුවෙන් අප හඳුන්වන්නේ අපේ චින්තනය ය. චින්තනය යන්න ඉංගිරිසි හෝ වෙනත් බටහිර භාෂාවකින් ලියැවුණු පොතක සඳහන් නොවන නිසා මෙරට අනුකාරක උගත්තු එය නොසළකා හරිති.) ඥාන විභාගය (එපිස්ටමොලොජි - තියරි ඔෆ් නොලේජ්) යන්නෙහි තේරුම දැනුම පිළිබඳ ප්‍රවාදය යන්න ය. දැනුම යනු කුමක් ද යන ප්‍රශ්නයට ඒ ඒ චින්තන තුළ ඇත්තේ විවිධ පිළිතුරු ය. ඥාන විභාගය යන්න දැනුම පිළිබඳ දැනුම ලෙස ද හැඳින්විය හැකි ය. බටහිර යුදෙව් චින්තනය තුළ ඥාන විභාගය සත්බවෙන් (ඔන්ටොලොජි) වෙන් කෙරෙයි. සත්බව යනු ලෝකයේ පැවැත්ම පිළිබඳ ඇති දැනුමයි. ලෝකය පවතින්නේ ද, එසේ පවතින්නේ නම් ඒ මිනිසාගෙන් ස්වායත්ත ව, ස්වාධීනව පවතින්නේ ද ආදී කරුණු එහි දී සාකච්ඡා කෙරෙයි. යුදෙව් චින්තනයෙහි ඥාන විභාගය සත්බවින් වෙන් කෙරුණ ද අපි සත්බව හා ඥාන විභාගය එකට ගනිමු. අපේ චින්තනය තුළ ඥාන විභාගය සත්බවින් වෙන් නොවෙයි. අප අනෙක් චින්තන ගැන ද කතා කරන්නේ අපේ චින්තනය තුළ පදනම් ව වන බැවින් අපි අනෙක් චින්තනවල ද සත්බව හා ඥාන විභාගය වෙන වෙන ම සාකච්ඡා නොකරමු.

© Prof. Nalin De Silva

චින්තනයක ඥාන විභාගයක්, දාර්ශනික පදනමක් හා ආකල්ප වෙයි. යුදෙව් චින්තනයට අදාළව මේ කරුණු මගේ ලෝකය කෘතියෙහි දෙවැනි හා තුන්වැනි මුද්‍රණවල සඳහන් වෙයි. චින්තනය නම් සංකල්පය නිර්මාණය කෙරී ඇත්තේ ද අපේ චින්තනය තුළ බැවින් මේ කරුණු සියල්ල සාකච්ඡා වන්නේ අපේ චින්තනයට සාපේක්ෂව ය. එබැවින් ඥාන විභාගය, දාර්ශනික පසුබිම හා ආකල්ප එකිනෙකින් වෙන් වූ දෑ ලෙස අපි නොගනිමු. ඒ කරුණු අතර ද අන්‍යොන්‍ය සම්බන්ධයක් වෙයි. සත්බව ද ඇතුළත් ඥාන විභාගය, දාර්ශනික පදනමින් මුළුමනින් ම වෙන් නොවෙයි. එමෙන් ම ආකල්ප ද ඒ දෙකෙන් මුළුමනින් ම වෙන් නොවෙයි.

දෙවියන් වහන්සේ ලෝකය මැවීය යන්න කතෝලික චින්තනයෙහි පමණක් නොව යුදෙව් චින්තනයෙහි ද, භාරතීය වෛදික චින්තනයෙහි ද, ඉස්ලාම් චින්තනයෙහි ද වෙයි. ඒ සියළු චින්තනවල ඥාන විභාගයෙහි පදනමෙහි දේව නිර්මාණය වෙයි. එහෙත් එපමණකින් ඒ චින්තන සියල්ල එකිනෙකට සමාන වන්නේ නොවේ. මේ සියළු චින්තනවල කියැවෙන්නේ එකම දෙවියන් වහන්සේ ගැන නොවේ. යුදෙව් චින්තනයෙහි කියැවෙන යෙහෝවා දෙවියන් වහන්සේට වඩා කතෝලික චින්තනයෙහි සඳහන්වන දෙවියන් වහන්සේ වෛදික බ්‍රහ්මන්ට සමීප වෙයි. එපමණක් නොවේ. කතෝලිකයන්ගේ දෙවියන් වහන්සේ කතෝලික නොවන ක්‍රිස්තියානින්ගේ දෙවියන් වහන්සේගෙන් වෙනස් වෙයි. මෙය ඇතැම් කතෝලිකයන්ගේ හා කතෝලික නොවන ක්‍රිස්තියානින්ගේ මවිතයට හේතු වන්නක් විය හැකි ය. කතෝලික මෙන් ම කතෝලික නොවන ක්‍රිස්තියානින් ද විශ්වාස කරන්නේ, පරණ ගිවිසුමෙහි හෙවත් පරණ තෙස්තමේන්තුවෙහි සඳහන් වන යුදෙව්වන් ද විශ්වාස කරන, යෙහෝවා දෙවියන් වහන්සේ යැයි ඔවුන් ප්‍රකාශ කරනු ඇත. නම එකම වුව ද ඉන් කියැවෙන්නේ වෙනස් දෙවියන් වහන්සේ ගැන ය. මෙය දේව නිර්මාණ ගැන විශ්වාස කරන ආගම්වලට පමණක් සීමා වූවක් නොවේ. සිංහල බෞද්ධයන් ද ඇතුළු ථෙරවාදීන් ගේ බුදු හාමුදුරුවෝ මහායාන බුදු හාමුදුරුවන්ගෙන් වෙනස් වෙති.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva